## එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලෙහි (UNICEF)

# කෙටිකාලීන පෝෂණ සංවේදී මුදල් ලබාදීමේ වැඩසටහන



## මෙම වැඩසටහන කුමක්ද?

යුනිසෙෆ් සංවිධානය, ශ්‍රී ලංකා රජයේද සහායැතිව **2021 මැයි 1 සහ 2022 දෙසැම්බර් 31** අතර කාලසීමාවේදී උපත ලද කුඩා දරුවන්ගේ පෝෂණය ඉහළ නැංවීම සඳහා දරුවන්ගේ මව්වරුන්ට/රැකබලාගන්නන්ට එළඹෙන මාසයන්හිදී මුදල් ලබාදීම් සිදු කිරීමට කටයුතු කරනු ඇත. මෙම වැඩසටහනෙන් දරුවාගේ මුල් මාස 24 දී ගර්භණී මව්වරුන්ට ලබාදෙනු ලබන වවුචරය අඛණ්ඩ ලෙස ලබාදීමත් එම තීරණාත්මක කාලපරිච්ඡේදයේදී නිවැරදි පෝෂණය සහ රැකවරණය ලබා දීමත් අරමුණු කෙරේ. එය හඳුනාගත් දැඩි පෝෂණ අවධානම් සහිත දිස්ත්‍රික්ක කෙරෙහි අවධානය යොමු කර ඇත. ප්‍රමුඛතාවය අනුව තෝරාගත් දිස්ත්‍රික්ක වන්නේ: **පුත්තලම, අනුරාධපුර, මොණරාගල, කෑගල්ල, කිලිනොච්චිය සහ මුලතිව්** ය. ඊට අමතරව, සෑම මවකටම හෝ රැකබලා-ගන්නෙකුට පෝෂණය සහ පවතින සෞඛ්‍ය සේවා සම්බන්ධ අමතර තොරතුරු ලැබෙනු ඇත.

## කොපමණ මුදලක් ලැබේද?

සුදුසුකම් ලත් මවකට/රැකබලාගන්නෙකුට එක් සුදුසුකම් ලත් දරුවෙකු සඳහා **වැඩසටහන් කාල සීමාව තුළ මාස 4ක් දක්වා රු. 6,750.00ක මාසික මුදල්** ලබාදීමක් සිදුකෙරෙනු ඇත. උදාහරණයක් ලෙස, 2023 පෙබරවාරි මාසයේ දී වැඩසටහන ආරම්භ වී 2023 මැයි දක්වා ක්‍රියාත්මක වන දිස්ත්‍රික්කයක,

→ ඔබේ දරුවාගේ වයස පෙබරවාරි මාසයේදී මාස 5  ක් හෝ ඊට වැඩි වන්නේ නම්, ඔබට පෙබරවාරි, මාර්තු, අප්‍රේල් සහ මැයි මාසවලදී ගෙවීම් කෙරෙනු ඇත

→ ඔබගේ දරුවාගේ වයස මාස 5 ක් වන්නේ මාර්තු මාසයට නම්, ඔබට ගෙවීම් කෙරෙනුයේ මාර්තු, අප්‍රේල් සහ මැයි මාසයන් සඳහා පමණි.

## ලියාපදිංචි විය හැක්කේ කා හටද?

**2021 මැයි 1 සහ 2022 දෙසැම්බර් 31** අතර කාල සීමාවේදී උපත ලද කුඩා දරුවන්ගේ සියලුම මව්වරුන්/රැකබලාගන්නන්. සුදුසුකම් ලැබීම සඳහා ඉහතින් දක්වා ඇති තෝරාගත් දිස්ත්‍රික්කවල මව/රැකබලාගන්නා පදිංචි වී සිටිය යුතුවේ.

## මුදල් ලබාදීම් සිදු කරන්නේ කෙසේද?

මුදල්/ගෙවීම් සාමාන්‍යයෙන් **බැංකු හුවමාරු** (bank transfers) හරහා සිදු කෙරේ. පළමු ගෙවීම 2023 වසරේ පළමු කාර්තුවේදී සිදුවනු ඇත. නිශ්චිත කාලය ඔබේ ස්ථානය හෝ පදිංචිය මත රඳා පවතී.

## ලියාපදිංචි කරන්නේ කවුරුන්ද සහ කෙසේද?

ප්‍රතිලාභීන් ලියාපදිංචි කිරීම බොහෝ දුරට ප්‍රාදේශීය මට්ටමෙන් සිදු කෙරෙන අතර ඒ සඳහා ගෙවීමක් කළ යුතු නොවේ. ලියාපදිංචිය සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය වැනි රජයේ කාර්යාලයක් වෙත පැමිණෙන ලෙස ඔබෙන් ඉල්ලා සිටිය හැක. ඇතැම් විටෙකදී, එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලෙහි (UNICEF) කෙටිකාලීන පෝෂණ සංවේදී මුදල් ලබාදීමේ වැඩසටහනේ ප්‍රතිලාභියෙකු වශයෙන් ලියාපදිංචි කිරීමට පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියක හෝ සංවර්ධන නිලධාරියෙකු විසින් ඔබ නිවසට පැමිණිය හැකිය. **ලියාපදිංචියේදී ඒ සඳහා සුදුසුකම්ලත් මව්වරුන්/රැකබලාගන්නන් පෞද්ගලිකවම පැමිණ සිටිය යුතු බව කරුණාවෙන් සලකන්න.** ලියාපදිංචි කටයුතු අවසන් වූ වහාම එම නිලධාරියා විසින් ඔබට ලියාපදිංචි අනන්‍යතා අංකයක් ලබා දෙනු ඇත. වැඩසටහන අවසන් වන තුරු ලියාපදිංචි අනන්‍යතා අංකය සුරැකිව තබා ගන්නා ලෙස ප්‍රතිලාභීන්ට දැනුම් දෙනු ලැබේ. ඔබගේ ලියාපදිංචිය සම්බන්ධයෙන් වන ඕනෑම විමසීමකදී, **ප්‍රතිලාභීන්ට ගාස්තු රහිත 1318 අංකය** හා සම්බන්ධ විය හැකි අතර එහිදී ප්‍රතිලාභීන්ගෙන් ලියාපදිංචි අනන්‍යතා අංකය තහවුරු කරන ලෙස ඉල්ලා සිටිනු ඇත.



## ලියාපදිංචිය සඳහා අවශ්‍ය ලේඛන මොනවාද?

- **සුදුසුකම්ලත් දරුවාගේ/දරුවන්ගේ උප්පැන්න සහතිකය (තිබේ නම්)**. උප්පැන්න සහතිකයක් නොමැති අවස්ථා-වක, ඔබට රෝහලෙන් නිකුත් කරන ලද උපත් විස්තරය /මවගේ කාඩ්පත ද ලබා දිය හැක.
- මවගේ/ රැකබලාගන්නාගේ **ජාතික හැඳුනුම්පත (තිබේ නම්)**. ජාතික හැඳුනුම්පත නොමැති නම්, ඔබට මවගේ / රැකබලාගන්නාගේ උප්පැන්න සහතිකය ද රැගෙන යා හැකිය.
- ඔබගේ ස්ථිර පදිංචිය ජාතික හැඳුනුම්පතේ හෝ උප්පැ-න්න සහතිකයේ සඳහන් ලිපිනයට වඩා වෙනස් නම්, අදාළ ග්‍රාම නිලධාරීවරයාගෙන් පදිංචිය තහවුරු කිරීමේ ලිපියක් රැගෙන එන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.
- මව/රැකබලාගන්නා සම්බන්ධ කරගත හැකි **ජංගම දුරකථන අංකයක්**.

## ප්‍රතිලාභී සත්‍යාපනය

ප්‍රතිලාභීන්ගේ තොරතුරු නැවත තහවුරු කරගැනීම සඳහා, UNICEF **සංවිධානය පුද්ගලික සමාගමක් වන** Multi Tech Solution **සමඟ හවුල්කාරිත්වයකට අවතීර්ණ වී ඇත**. ඒ අනුව එම ආයතනයේ නිලධාරීන් ඔබගේ තොරතුරු තහවුරු කරගැනීම සඳහා ඔබ හමුවීමට හෝ දුරකතන ඇමතුමක් ලබාදීමට කටයුතු කරනු ඇත. ප්‍රතිලාභීන්ගේ තොරතුරු නැවත තහවුරු කිරීම සිදුවන්නේ යෝග්‍යතාවය තහවුරු කරගැනීමට සහ සමීක්ෂණ කටයුතු සඳහා පමණක් වන අතර ලියාපදිංචි වූ ප්‍රතිලාභීන්ගෙන් ඔවුන්ගේ තොරතුරු ලබා දෙන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

## ඔබගේ බැංකු ගිණුම ලියාපදිංචි කිරීම සිදු කරන්නේ කෙසේද?

සෑම මවක/රැකබලාගන්නෙකු විසින්ම **සක්‍රිය බැංකු ගිණුමක විස්තර සපයා තිබීම** අවශ්‍ය වේ. **මවට හෝ රැකබලාගන්නාට තවමත් බැංකු ගිණුමක් නොමැති නම්, ගිණුමක් විවෘත කිරීමට අපි ඔවුන්ව දිරිමත් කරමු**. විකල්පයක් ලෙස, ප්‍රතිලාභීන්ට එකම නිවස තුළ සිටින වෙනත් පුද්ගලයෙකුගේ බැංකු ගිණුම සඳහන් කළ හැකිය. පහත තොරතුරු අවශ්‍ය වේ:

- බැංකුවේ නම, බැංකු ශාඛාව, ශාඛා කේතය සහ ගිණුම් අංකය
- බැංකු පාස්පොත
- ලබා දී ඇති බැංකු ගිණුම මවගේ/රැකබලාගන්නාගේම බැංකු ගිණුමක් නොව වෙනත් ගෘහ සාමාජිකයෙකුගේ ගිණුමක් නම්, සාමාජිකයාගේ ජාතික හැඳුනුම්පත් අංකය.

**සමෘද්ධි සහ ග්‍රාමීය බැංකු ගිණුම් හැර** අනෙකුත් සියලුම බැංකු ගිණුම් පිළිගනු ලබන බව සලකන්න

## වැඩි විස්තර ලබා ගන්නේ සහ පැමිණිලි වාර්තා කරන්නේ කෙසේද?

ප්‍රතිලාභීන්ට තොරතුරු සැපයීමට සහ පැමිණිලි හෝ දුක්-ගැනවිලි විසඳීමට මව්වරුන්ට/රැකබලාගන්නන්ට සහාය වනු පිණිස යුනිසෙෆ් සංවිධානය සර්වෝදය සමඟ හවුල්කාරිත්-වයකට එළඹ ඇත. එබැවින් **ඔබට කිසියම් ප්‍රශ්නයක් ඇත්නම් හෝ සහාය අවශ්‍ය නම්, කරුණාකර එය 1318 අංකය ඇමතීම මඟින් හෝ කෙටිපනිවුඩයක් මඟින්** හෝ සිදුකරන මෙන් ඉල්ලා සිටිමු. සතියේ දින පහම උදේ 9 සිට සවස 4 දක්වා ක්‍රියාත්මක වන මෙය ගාස්තු රහිත ක්ෂණික ඇමතුම් අංකයකි. පැමිණිලි/ දුක්ගැනවිලිවල රහස්‍යභාවය සහතික කෙරෙන බව අපි තහවුරු කරන්නෙමු.

මුදල් ලැබීම් තහවුරු කිරීමට සහ පෝෂණ ක්‍රියාකාරකම් සිදු කිරීමට සර්වෝදය ව්‍යාපාරය විසින්ද ප්‍රතිලාභීන් ඇමතිය හැකිය.

**සහාය සහ පැමිණිලි සඳහා අමතන්න**

**1318**

(සතියේ දින උදේ 9 සිට සවස 4 දක්වා)


Australian Government
AusAID

USAID
FROM THE AMERICAN PEOPLE

සර්වෝදය
சர்வோதயம்
Sarvodaya

unicef
for every child
සෑම දරුවෙක් වෙනුවෙන්ම
ஒவ்வொரு சிறுவர்களுக்காகவும்